# ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය නව මඟකට යොමුකළ බහු වාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය

කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය යටතේ 1989 සිට ක්‍රියාත්මක වන බහු වාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වන්නේ, ශ්‍රී ලංකාවේ බහු වාර්ෂික බෝග නිෂ්පාදනය වැඩි කිරීම, උසස් තත්ත්වයේ බහු වාර්ෂික බෝග නිෂ්පාදනය, එම අස්වනු සැකසීම, එම අස්වනු යොදා සුළු හා මධ්‍ය පරිමාණයේ කර්මාන්ත ඇති කිරීම සහ එම නිෂ්පාදන සඳහා වෙළඳපළ පහසුකම් ඇති කිරීමයි.

1948 දී දේශපාලන වශයෙන් නිදහස ලැබූ දා සිටම අපේ රටේ කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා කටයුතු කළේ සහලින් රට ස්වයංපෝෂණය කිරීමටත් වැවිලි අංශයෙන් (තේ, පොල්, රබර්) ලැබෙන ආදායම හා ඒවා අපනයනයෙන් උපයා ගත හැකි විදේශ විනිමය වැඩි කර ගැනීමටත්ය. මෙහි ප්‍රතිඵල ලෙස දිගුකාලීන කෘෂිකාර්මික පර්යේෂණ තුළින් උසස් ආරයේ වී වර්ග බිහිකර ගැනීමත්, දියුණු වගා ක්‍රම, වත් පිළිවෙත් අනුගමනය කිරීමත් විශාල වාරි කර්මාන්ත ව්‍යාපෘති (උදා: මහවැලි) බිහිවීමත් නිසා 1980 ගණන් වන විට සහල් හා අනිකුත් අතිරේක බෝග නිෂ්පාදනයේ ඉතා සැළකිය යුතු වර්ධනයක් දක්නට ලැබුනද පලතුරු, අපනයන කෘෂිකර්ම බෝග, උක් වැනි ඉතා වැදගත් බහු වාර්ෂික බෝග නිෂ්පාදන වර්ධනය පිළිබඳ නිසි අවධානය යොමු නොවීය.

ආර්ථික වශයෙන් වැදගත්වන බහු වාර්ෂික බෝග වශයෙන් කෝපි, කොකෝවා, කුරුඳු, ගම්මිරිස්, එනසාල් වැනි අපනයන කෘෂිකර්ම බෝග ද, අඹ, දෙහි දොඩම්, රඹුටන්,වැල්දොඩම්, අන්නාසි, පැපොල්, කෙසෙල් වැනි පලතුරු බෝග ද අයත්වේ. මේවායින් බොහොමයක්ම ගෙවතු වගා මට්ටමෙන් වගාකර ඇති අතර, හෙක්ටයාරයකට ලබාගන්නා අස්වැන්න ඉතාම අඩුය. මීට හේතු රාශියකි.

මෙම දුර්වල අස්වැන්න ද එම අස්වැන්නේ අඩු ගුණාත්මය ද විසඳාලිය යුතු මූලික ගැටළු අතර වෙයි.

මේ තත්ත්වයෙන් මිදීමටත්, ඉඩම්වලින් වැඩි ප්‍රයෝජනයක් ලබා ගැනීම සඳහාත් යටකී අරමුණ ඉටුකර ගැනීම සඳහාත් ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර සහිතව කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයෙත්, ශ්‍රී ලංකා මහ බැංකුවේ ග්‍රාමීය ණය අංශයේත්, ණය දෙන ආයතන (බැංකු) සමඟ එක්වී බහු වාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන අවස්ථාවේ සිට අද දක්වාම ගෙවතු මට්ටමේ හා අඩු කැපවීමකින් අඩු නිෂ්පාදන යෙදවුම් සහිතව අඩු කාර්යක්ෂමතාවකින් වූ යටකී බෝග නිෂ්පාදනයේ නව නැම්මක් ඇති කරමින් රටේ කෘෂිකර්මයට නව වටිනාකමක් , නව අරමුණක් ලබාදීමට මෙම ව්‍යාපෘතිය කටයුතු කරයි. එමෙන්ම එම බෝගවල අස්වැන්න උසස් ගුණාත්මක මට්ටමකින් සකස් කිරීම, පරිහරණය කිරීම හා ඒවා ආශ්‍රිත විවිධ කර්මාන්ත ඇති කිරීම සඳහා ද මෙමඟින් කටයුතු කෙරේ.

තාක්ෂණික දැනුම හා කෘෂිකාර්මික උපදෙස් නොමිලයේම ලබා දුන්න ද, අලෙවිය හා මිලෙහි ඇති අස්ථාවරභාවය නිසා ගොවි මහත්වරුන් මෙම බෝග සඳහා ආයෝජනය කිරීමට පසුබට වන බව පැහැදිලි කරුණකි. සාමාන්‍යයෙන් කෘෂිකර්මයේ අවදානම් බව ඉතා වැඩිය. එසේ වුවද, මෑතක සිට එම බෝගවලද නිෂ්පාදන වියදම ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති බව කිව යුතුය. කරුණු එසේ වුවද, ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූ බෝග වගා සහනාධාර ප්‍රමාණය එම බෝගවල නිෂ්පාදන වියදමෙන් ඉතා සුළු කොටසක් වීම බහු වාර්ෂික බෝග නිෂ්පාදනය වැඩිකිරීමට ඇති තවත් අවහිරයකි.


බහු වාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපාරයේ පර්යේෂණ නිලධාරී

සුගත හීන්කෙන්ද හා

නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති)

තිස්ස බී හේරත් විසිනි.


ඉහත සඳහන් අවහිරතා සහ ගැටලු සහගත තත්ත්වයන් වෙත දැඩි අවධානය යොමු කොට ඒවාට විසඳුම් ලබාදීමේ අරමුණ ඇතිව මෙම බහු වාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

මෙම ව්‍යාපෘතිය යටතේ පහසු ණය හා සහනාධාර ක්‍රමයක් මඟින් මුදල් පහසුකම් හා අවශ්‍ය දැනුම අදාළ ආයෝජකයින්ට එක ආයතනයක් තුළින් ලබාදීම මඟින් බහු වාර්ෂික බෝග නිෂ්පාදන ක්ෂේත්‍රය ශ්‍රී ලංකාවේ සංවර්ධනයට දායකකර ගැනීමට කටයුතු කෙරේ. මෙම ව්‍යාපෘතියෙන් අවම වශයෙන් හෙක්ටයාර් 9000ක් සංවර්ධනය කිරීමත්, එම බෝග නිෂ්පාදනය වසරකට මෙට්‍රික් ටොන් 25000ක් පමණ වැඩිකර ගැනීමටත් අපේක්ෂා කෙරේ. එමඟින් ඉපැයෙන අමතර ආදායම රුපියල්

**මිලියන 660ක් පමණ වන අතර, නව රැකියා අවස්ථා 10000ක් වත් ඇතිවේ යැයි අපේක්ෂා කෙරේ.**

මෙම ව්‍යාපෘතියෙන් බහු වාර්ෂික බෝග ප්‍රමුඛ කෘෂි ආයෝජනයකට අක්කරයකට රු.50,000 දක්වා වසරකට 14% ක පොලියකට ණය මුදලක්ද, බෝග නිෂ්පාදනය සඳහා රජයේ නිර්දේශිත සහනාධාර අක්කර තුනට වැඩි වගාවක් සඳහා තවදුරටත් 50% ක් වැඩියෙන් ද, ණය ආපසු ගෙවීමට පෙර ආයෝජනයේ ස්වාභාවය අනුව උපරිමව අවුරුදු 5 ක සහන කාලයක් ද, සහන කාලය ඇතුළත්ව ණය ගෙවා නිම කිරීමට උපරිම කාලය අවුරුදු දහයක් ද ලබාදෙනු ලැබේ. ආයෝජනයේ ලාභයෙන් එම ණය ගෙවීමට කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෙම ව්‍යාපෘතිය දැනට විශේෂයෙන් ක්‍රියාත්මක වන දිස්ත්‍රික්ක නම් කෑගල්ල, මහනුවර, මාතලේ, බදුල්ල, මොණරාගල, ගම්පහ, පුත්තලම සහ කුරුණෑගලයි. ඊට අමතරව මෙම දිස්ත්‍රික්කවලින් පිටතින් වුවද ඉදිරිපත් කෙරෙන ඉල්ලුම්පත් ගැන සලකා බලනු ලැබේ.

ව්‍යාපෘතියේ විශේෂ ආයෝජන සැලසුම් හා උපදේශක සේවාවන් සැපයේ. ව්‍යාපෘතියේ පහසුකම් ලබාගෙන තවාන්, වගාවන් හෝ අස්වැන්න සැකසීමේ හෝ පරිහරණය කිරීමේ ආයෝජනයන් සඳහා අයදුම් කරන ව්‍යවසායකයින් සඳහා මෙම සේවාව ලබා දෙනු ලැබේ.

**ව්‍යාපෘතියේ පහසුකම් බලාපොරොත්තු වන අයදුම්කරුවන් සමඟ සාකච්ඡා කොට ඔවුන්ගේ කැමැත්ත ද අවශ්‍යතාවන් ද සලකා බලා ගොවිපළ වැඩි දියුණු කිරීමේ හෝ ගොවිපළක් පිහිටුවීමේ සැලැස්මක්, ඇස්තමේන්තු හා ආදායම් වියදම් පිළිබඳ සැලැස්මක් හා ණය/සහනාධාර මුදා හැරීමේ සැලැස්මක් පිළියෙල කර අයදුම්කරු ගනුදෙනු කරන බැංකුව වෙත ඉදිරිපත් කෙරේ. ඒ ඒ දිස්ත්‍රික්ක මට්ටමේ සිටින සහකාර අධ්‍යක්ෂ (ගොවිපළ සැලසුම්) වරයෙකු හා ප්‍රාදේශීය මට්ටමේ ගොවිපළ සැලසුම් නිලධාරින් ගේ සේවය සෑම පියවරකදීම සැපයේ.**

**ගොවිපොළේ සංස්ථාපනය කරනු ලබන බෝගය සාර්ථකව නඩත්තු කිරීමටත්, ගොවිපොළ වැඩි දියුණු කිරීමටත් අවශ්‍ය වන තාක්ෂණික උපදෙස් ගොවිපොළට පැමිණ ගොවිපොළ සැලසුම් නිලධාරී මහතා විසින් නොමිලයේම ලබාදෙනු ඇත. නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති) විසින් මෙම කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය සැලසුම් සහ උපක්‍රම සකස් කරනු ලැබේ. ඒ අතරතුරදී ගොවිපොළ සංවර්ධනයේදී මතුවන කෘෂිකාර්මික ගැටලු සියල්ල විසඳා ගැනීමට අවශ්‍ය වන ඕනෑම අවස්ථාවක ප්‍රදේශයේ ගොවිපොළ සැලසුම් නිලධාරී මහතාගේ සේවය ලබාගත හැකිය. ඒ මහතා සෑම බදාදා දිනකම ගොවිජන කේන්ද්‍ර ගොඩනැගිල්ලේ ඔහුගේ කාර්යාලයේ රැඳී සිටිමින් ගොවි මහත්වරුන් වෙනුවෙන් කාර්යාල දිනයක් පවත්වයි.**

බැංකුවලින් නිකුත් කෙරෙන ණය වාරික ගෙවීම නිර්දේශ කරන්නේ ගොවිපොළ සැලසුම් නිලධාරී මහතායි. බැංකු කටයුතුවලදී පැන නැඟිය හැකි ගැටලු විසඳා ගැනීමට ද නිරතුරුවම ගොවිපොළ සැලසුම් නිලධාරී මහතා ගොවි මහත්වරුන්ට සහාය වනු ඇත. ගොවිපළ සැලසුම් නිලධාරීන්ගේ සේවය නිසි ලෙස ලබාදීම සඳහා සහකාර අධ්‍යක්ෂවරු ද, නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති) ද සේවයට කැපවී සිටිති.

සහකාර අධ්‍යක්ෂ (ගොවිපොළ සැලසුම්) වරයා අදාළ දිස්ත්‍රික්කයේ ගොවිපොළ සංවර්ධන කටයුතුවලට සෘජුවම වගකීමකින් යුතුව මැදිහත් වෙයි. ඔහු ගොවිපොළ සැලසුම් නිලධාරී මහතාට විසඳීමට අපහසු වූ ගැටලු විසඳීමට ද, ගොවිපොළ සංවර්ධනයේදී පැන නඟින සංකීර්ණ ගැටලු විසඳීමට හා සහනාධාර නිදහස් කිරීමට අවශ්‍ය නිර්දේශය හා, වෙනත් විශේෂ අවස්ථාවලදී අවශ්‍ය වන විශේෂ සේවාවන් ගොවි මහත්වරුන්ට සැපයීමට ද අවශ්‍ය කටයුතු සම්පාදනය කරයි. ඔහු ගොවිපොළ සංවර්ධනය සම්බන්ධ කටයුතු පේරාදෙණියේ පිහිටි බහු වාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතියේ කළමණාකරණ ඒකකය (මූලස්ථාන) නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති) මඟින් ඉටුකරයි. නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති) මේ සියලු කටයුතු සම්බන්ධීකරණය හා සමායෝජනය කරන අතර ව්‍යාප්ති අංශයේ සැලසුම් සකස් කිරීම ද සිදු කරයි. සහකාර අධ්‍යක්ෂට විසඳාලිය නොහැකි ගැටලු නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති) වෙත වාර්තා කර අවශ්‍ය උපදෙස් ලබාගන්නා අතර, ව්‍යාපෘතියෙන් සේවය ලබන ආයෝජකයන්ට ලබාදිය හැකි උපරිම සේවය ලබාදීමට මූලස්ථානයේ සහය ලබාගනී. සහකාර අධ්‍යක්ෂ (මූලස්ථාන) විසින් ක්ෂේත්‍ර කටයුතු පරීක්ෂා කිරීම ද, ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳ ඇගයීම් වාර්තා සකස් කිරීම ද, සන්නිවේදන වැඩසටහන් සකස් කිරීම ද සිදුකරයි.

මීට අමතරව ජ්‍යෙෂ්ඨ ශෂ්‍ය විද්‍යාඥයින්ගේ සේවය ව්‍යාපෘති මූලස්ථානයෙන් ව්‍යවසායකයින්ට අවශ්‍ය අවස්ථාවලදී ලබාදෙනු ඇත. ගොවිපොළ සැලසුම් සකස් කිරීම, බෝග රටා නිර්ණය කිරීම, බෝග නිර්දේශ කිරීම, රෝග හා පලිබෝධ හඳුනාගැනීම හා මර්ධනය, බෝග පුහුණු කිරීම, කප්පාදුව, බෝග නිෂ්පාදනය ආදී කටයුතුවලදී අවශ්‍ය නම් ජ්‍යෙෂ්ඨ ශෂ්‍ය විද්‍යාඥයින්ගේ සේවය කෙළින්ම ලබාදෙනු ලැබේ.

**කෘෂි ආයෝජනයන් සඳහා අවශ්‍ය මුදල් සැලසුම් සකස් කිරීම, ගොවිපොළ සැලසුම් සම්බන්ධ මූල්‍ය වියදම් ආදායම් ඇස්තමේන්තු සැකසීම, ණය වාරික සකස් කිරීම, ණය ආපසු අයකර ගැනීම හා ඒ සම්බන්ධ ගැටලු විසඳීමට අවශ්‍ය පියවර ගැනීමද නියෝජ්‍ය අධ්‍යක්ෂ (ණය) සහ කෘෂි ආර්ථික විද්‍යාඥ විසින් කරනු ලැබේ. ගොවි මහත්වරුන්ගේ ණය වාරික සම්බන්ධ ගැටලු හා ණය ආපසු ගෙවීම සම්බන්ධ ගැටලු විසඳීමට මොවුන් ගෙන් සහාය ලැබෙනු ඇත.**

**අස්වනු සකස් කිරීමේ සුළු හා මධ්‍ය ප්‍රමාණයේ ආයෝජන (කර්මාන්ත) සඳහා ද ව්‍යවසායකයින්ට අවශ්‍ය ආයෝජන සැලසුම් සකසා දීමට හා නොකඩවාම තාක්ෂණික උපදෙස් හා ප්‍රමිති ඇගයීම් කිරීමට පසු අස්වනු සැකසීමේ විශේෂඥයෙකු හා විෂය භාර නිලධාරියෙකුගේ සේවාව ලබාදෙයි.**

නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) වෙතින් මෙම සියලු නිලධාරීන්ගේ සම්බන්ධීකරණය හා පරිපාලනමය කටයුතු ඉටුවෙයි. ඒ නිසා කලට වේලාවට සැලසුම් ක්‍රියාත්මක කිරීමට මෙන්ම මුදල් ප්‍රතිපාදන නිදහස් කිරීමට හැකි පසුබිම සැකසේ.

මුළු ව්‍යාපෘතියේම කටයුතු සමායෝජනය කරමින් නිලධාරීන්ගේ උපරිම සේවය ගොවි මහත්වරුන්ට හෝ ආයෝජකයින්ට ලබාදීමේ කාර්යාවලිය මනාලෙස සැලසුම් කිරීම, තීරණ ගැනීම හා කළමනාකරණය ව්‍යාපෘති අධ්‍යක්ෂගෙන් ඉටුවේ.

ව්‍යාපෘතියේ ණය සහ සහනාධාර ක්‍රමය සඳහා ආයෝජකයාගේ දායකත්වය 20%ක්ද, ණය සහ සහනාධාර 80%ක්ද වෙයි.

ණය ලබා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

1. වගා කරන ඉඩම අයදුම්කරු සතු විය යුතුය. බදු ඉඩමක් නම් වර්ෂ 8ක් පමණ ඉදිරියට බදු කාලය තිබිය යුතුය.
2. එම ඉඩමට කුඹුරක් තිබිය යුතු අතර, එම කුඹුරෙහි මායිම හා ඔප්පුවෙහි මායිම සමාන විය යුතුය.
3. බලපත්‍ර සහිත ඉඩම්වලට මායිම් සඳහන් සහතිකයක් ඉඩම් කාර්යාලයෙන් ලබාගත යුතුය. වාර්ෂික බලපත්‍ර පිළිගනු නොලැබේ.
4. බැංකුව පිළිගත් ගනුදෙනුකරුවෙකු විය යුතුය.

ඉදිරිපත් කළ යුතු සුරැකුම් :-

1. රු. ලක්ෂ 2 දක්වා -

   පුද්ගල ඇප හෝ ගොවිජන සේවා උකස

2. රු. ලක්ෂ 2 ට වැඩි -

   වගා කිරීමට බලාපොරොත්තු වන ඉඩම හෝ වෙනත් දේපළ උකසක්

මෙම ණය සහ සහනාධාර ක්‍රමය යටතේ පහත සඳහන් ආයෝජනයන් සඳහා පහසුකම් ලබාගත හැකිය.

1. අඹ, දෙහි, දොඩම්, කජු, අන්නාසි, පැපොල්, කෙසෙල්, වැල්දොඩම්, රඹුටන්, කෝපි, කොකෝවා, ගම්මිරිස්, කරදමුංගු වැනි බහු වාර්ෂික බෝග හා ඒ සමඟ අතුරුබෝග වගාවක් සඳහා අක්කරයකට රු.50,000 දක්වා ණය හා සහනාධාර.
2. පොල් ඉඩම්වල බහු වාර්ෂික බෝග ප්‍රමුඛ අතුරු බෝග වගාවන් සමඟ පොල් ඉඩම් සංවර්ධනයට.
3. බහු වාර්ෂික බෝග හෝ එම බෝග ප්‍රමුඛ බෝග රටාවන් සමඟ ගවයන් හා එළුවන් ඇතුළත් ඒකාබද්ධ ගොවිපළ ඇති කිරීම සඳහා.
4. බහු වාර්ෂික බෝග පැළ තවාන් කිරීමට හා ඇති තවාන් වැඩි දියුණු කිරීම සඳහා
5. බහු වාර්ෂික බෝග අස්වැන්න සකස් කිරීමේ හෝ පරිහරණය කිරීමේ හෝ එම අස්වැන්න යොදා ගන්නා සුළු හා මධ්‍ය ප්‍රමාණයේ කර්මාන්තයන් ඇති කිරීම සඳහා.

බහු වාර්ෂික බෝග නිෂ්පාදනය වැඩි කිරීමෙන් පැන නඟින අලෙවි දුෂ්කරතා පිටු දැකීම සඳහා ද කටයුතු කර ඇත. ඒ අනුව අලෙවිය පිළිබඳ යටිතල පහසුකම් සැපයීම ද මෙම ව්‍යාපෘතියෙන් ඉටු කෙරෙන ඉතා වැදගත් මෙහෙයකි. ඒ යටතේ මහනුවර හා දඹුල්ල තොග වෙළෙඳපොළ සංකීර්ණ දෙකක් ද හඳුනාගත් ප්‍රාදේශීය සභා මට්ටමෙන් සතිපොළ 11ක්ද ඉදිකිරීමට කටයුතු කෙරෙමින් පවතී. උදා : බිබිල, මහියංගන, රඹුක්කන සතිපොළ

ණය සහ සහනාධාර මුදල ආයෝජන අවශ්‍යතාව අනුව වාරික කීපයකින් ලබාදෙනු ඇත. කලින් තෝරා ගත් ගොවිජන කේන්ද්‍රවල පිහිටුවා ඇති ගොවිපොළ සැලසුම් නිලධාරී කාර්යාලවලින් ද බොහෝ විට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සම්බන්ධව පිහිටුවා ඇති දිස්ත්‍රික්කයේ සහකාර අධ්‍යක්ෂ (ගොවිපොළ සැලසුම්) ගේ කාර්යාලවලින් ද පේරාදෙණියේ ගොවිපොළ තැ.පෙ.1094හි පිහිටුවා ඇති ව්‍යාපෘති මූලස්ථානයෙන් ද අදාළ ව්‍යවසායකයින්ට සෑම අතින්ම අවශ්‍ය සහාය නිරන්තරයෙන්ම ලබාදීමට කටයුතු කරනු ඇත.